“ඔබ කියන පරිදි වන්නෙහි නම් එය ඔබ ඔවුනට උණු අලු කන්නට දෙන්නාක් මෙනි. තවද ඔබ එසේ ක්රියා කරමින් සිටින තාක්කල් අල්ලාහ්ගෙන් වූ උදව්කරුවකු ඔබ සමග සිටින්නේමය.”

අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: සැබැවින්ම මිනිසෙක්: ‘අල්ලාහ්ගේ දූතයාණනි! මට නෑදෑයෝ සිටිති. මම ඔවුන් සමග සම්බන්ධකම් පවත්වමි. නමුත් ඔවුන් මා කපා හරිති. මම ඔවුන් සමග උපකාරශීලීව කටයුතු කරමි. නමුත්
ඔවුන් මට නපුරුකම් කරති. ඔවුන් ගැන මම ඉවසමි. නමුත් ඔවුන් මා සමග අඥාන ලෙස කටයුතු
කරති. යැයි පැවසීය. එවිට එතුමාණෝ: “ඔබ කියන පරිදි වන්නෙහි නම් එය ඔබ ඔවුනට උණු අලු කන්නට දෙන්නාක් මෙනි. තවද ඔබ එසේ ක්රියා කරමින් සිටින තාක්කල් අල්ලාහ්ගෙන් වූ උදව්කරුවකු ඔබ සමග සිටින්නේමය.” [صحيح] [رواه مسلم]

සැබැවින්ම මිනිසෙක් අල්ලාහ්ගේ දූතයාණන් වෙත පැමිණ තමන්ට නෑදෑයින් සිටින බවත්, තමා ඔවුන් සමග සම්බන්ධකම් පවත්වන නමුත් ඔවුන් ඊට විරුද්ධව කටයුතු කරන බවත් පැමිණිළි කළේය. එසේ තමාව කපා හරින තත්ත්වයේ පවා ඔහු ඔවුන් සමග සම්බන්ධකම් පවත්වා ඔවුන් සමග උපාකාරශීලීව කටයුතු කරන බවත් ඔවුන් ඔහුට නපුරුකම් කරන නමුත් ඔහු ඉවසා දරා ඔවුනට සමාව දෙන බවත් ඔවුන් පිළිකුල් සහගත ලෙස තමන් සමග කතාවෙන් හා ක්රියාවෙන් කටයුතු කරන බවත් දන්වා මේකී කරුණු සැලකිල්ලට ගෙන ඔවුන් සමග අඛණ්ඩව සම්බන්ධකම් පැවැත්විය හැකිදැ?යි විමසා සිටියේය. එවිට නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්, "ඔබ කියන පරිදි වී නම්, එනම් ඔවුන් ඔබව අපකීර්තියට පත් කර, පහත් කොට සළකන්නේ නම්, එය ඔබ ඔවුනට උණු අලු කන්නට දෙන්නාක් මෙනි. එය ඔවුන්ගේ ක්රියාවන් පිළිකුල් සහගත වුව ද ඔබ අධික ලෙස උපකාරශීලීව කටයුතු කළ හේතුවෙනි. ඔබ පවසන පරිදි ඔබ වෙත ඔවුන් නපුරුකම් කරමින් සිටිය ද ඔබ ඔවුන් සමග අඛණ්ඩව උපකාරශීලීව කටයුතු කරන තාක්කල් ඔවුන් විසින් සිදුවන හිංසනයන්ගෙන් අල්ලාහ් ඔබව ආරක්ෂා කරනු ඇත. ඔවුනට එරෙහිව උදව් කරන්නා ඔහුය. අල්ලාහ් ඔබ සමගම සිටියි." යැයි පැවසුහ.

http://sunnah.global/hadeeth/si/show/3863